ලංකා බැංකුවේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම විසින් පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති උද්‍යෝගිමත් සහ ඵලදායී ප්‍රතිඵල හඹායන තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මූලික බැංකුකරණ පද්ධති සහාය විශ්ලේෂක (කොන්ත්‍රාත් පදනම)

1. අධ්‍යාපනික සුදුසුකම්

- තොරතුරු තාක්ෂණ හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක පිළිගත් උපාධියක් **(ඔබගේ අයදුම්පත සමඟ පිටපතක් අමුණා එවන්න)**

2. වෘත්තීය සුදුසුකම්

පහත සඳහන් තොරතුරු තාක්ෂණ විෂයයන් අතරින් ඕනෑම එකක වෘත්තීය සහතික තිබීම වඩාත් යෝග්‍ය වේ
(කරුණාකර ඔබගේ අයදුම්පත සමඟ පිටපත් අමුණා එවන්න)

- RPG (II, III, 400, ILE) ක්‍රමලේඛනය
  වෙනත් ඕනෑම ක්‍රමලේඛන භාෂාවක්
- ITIL පදනම් පාඨමාලාව අමතර සුදුසුකමක් වනු ඇත

3. සේවා පළපුරුද්ද

- RPG (II, III, 400, ILE,) ක්‍රමලේඛනය පිළිබඳ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්දක් තිබිය යුතුය නැතහොත්
- මෘදුකාංග සංවර්ධනය පිළිබඳ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්දක් තිබිය යුතුය
- මූලික බැංකුකරණ යෙදවුම් සංවර්ධන කණ්ඩායම සමඟ වැඩකර තිබීම මෙන්ම end-to-end systems development life cycles, waterfall, Agile, DevOps සහ මෘදුකාංග සංවර්ධනයට අදාළ වෙනත් නූතන ප්‍රවේශයන් පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත

4. වයස් සීමාව

- අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 35 හෝ ඊට වඩා අඩුවිය යුතුය.

- **ගිවිසුම් කාලපරිච්ඡේදය**
  - මුළු කොන්ත්‍රාත් කාලය වසර 03 කි. (වාර්ෂික ප්‍රගති සමාලෝචනයට යටත්ව)
- **වැටුප් පරිමාණය**
  - සාකච්ඡා කළ හැක. අයදුම්කරුගේ නිපුණතාව මත ආකර්ෂණීය වැටුප් පැකේජයක් පිරිනැමේ.
- **වෙනත් සුදුසුකම්**
  - ස්වයං අභිප්‍රේරිත බව සහ ප්‍රතිඵල දිශාභිමුඛ බව
  - ගැටලු නිරාකරණයේ විශිෂ්ටත්වය හා ඉහළ නව්‍යකරණමය හැකියාව
  - කාර්යාල වේලාවෙන් පසුව හා සතිඅන්ත/ නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ

අයදුම්කිරීමේ පටිපාටිය

- අයදුම්කරුවන් සිය අයදුම්පත්, උපාධි සහතික සහ අවශ්‍ය වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික මෙන්ම අදාළ සෙසු සියලු අධ්‍යාපන සහතිකවල පිටපත් සමඟ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සනාථ කරන ලියකියවිලිවල ජායාපිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් ලිපිකවරයක බහා අදාළ ලිපිකවරයේ වම් ඉහළ කෙළවර අයැදුම් කරන තනතුර සඳහන් කොට පහත ලිපිනයට **2026/11/25** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත සඳහන් ඊමේල් ලිපිනය ඔස්සේ යොමුකළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉහත සඳහන් සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අදාළ ලියකියවිලිවල ජායා පිටපත් රහිතව ඉදිරිපත් කරනු ලබන හෝ සාවද්‍ය තොරතුරු සපයන ලද සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් නැවත දැනුම්දීමකින් තොරව බැඳවා ගැනීමේ කාර්ය පාටිපාටියේ ඕනෑම අවස්ථාවක ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී
බීඕසී අයිටී සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම,
18 වන මහල, ලංකා බැංකුව - ප්‍රධාන කාර්යාලය,
"ලංකා බැංකු චතුරස්‍රය", අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන: 011 476 4891
ඊමේල්: career@bocits.lk

BOC IT Solutions (Pvt) Ltd
(A fully owned subsidiary of the Bank of Ceylon)

• කිසියම් හෝ ආකාරයකින් බලපෑම් කිරීම වහාම නුසුදුසුකමක් බවට පත්විය හැකිය. • තෝරාගත් අපේක්ෂකයින් පමණක් කැඳවීමේ අයිතිය සමාගම සතුය.
• පිරවිය යුතු තනතුරු සංඛ්‍යාව හෝ බැඳවා ගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය සමාගම සතුය.